ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1355/4 – 2004 අගෝස්තු 23 වැනි සඳුදා – 2004.08.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

27 (1) වගන්තිය යටතේ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, එකී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදනු ලැබූ 1995 නොවැම්බර් මස 07 වැනි දින අංක 896/2 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරනු ලැබූ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සම්බන්ධ නියමයෙහි (IV) ඡේදයේ "හා ව්‍යවහාරික විද්‍යා සඳහා වූ පීඨ පවරා දෙමි ; තවද" යන වචන වෙනුවට ව්‍යවහාරික විද්‍යා හා භූ විඥාපන සඳහා වූ පීඨ පවරා දෙමි ; තවද" යන වචන ආදේශ කිරීමෙන් සහ උපලේඛනයේ අවසානයට පිළිවෙලින් (I) වන තීරය සහ (II) වන තීරය යටතේ පහත දැක්වෙන කොටස් එකතු කිරීමෙන් එම නියමය සංශෝධනය කරනු ලැබේ.

| | |
|---|---|
| "භූ විඥාපන පීඨය | මැනුම් හා භූමිතික අධ්‍යයනාංශය<br><br>සිතියම්කරණ, ඡායා රේඛණමිතික, දුරස්ථ ග්‍රහණගෝචර හා භූගෝලීය තොරතුරු පද්ධති අධ්‍යයනාංශය." |

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපතිනි.

2004ක් වූ අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

09-209

IA-G 004687 - 1140 (2004/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.